# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 22 දරන ශ්‍රී ලංකා බෞද්ධ විහාර දේවාල පදනම (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 05 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 ජූලි මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 7.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

## 2007 අංක 22 දරන ශ්‍රී ලංකා බෞද්ධ විහාර දේවාල පදනම (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2007 ජූලි මස 05 වන දින]

එල්. ඩී. —ඕ.අයි. එන්. සී. 9/2005.

### ශ්‍රී ලංකා බෞද්ධ විහාර දේවාල පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"ශ්‍රී ලංකා බෞද්ධ විහාර දේවාල පදනම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පදනමක්, එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී පදනමට සම්බන්ධ සියළු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී පදනම විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1**. මේ පනත 2007 අංක 22 දරන ශ්‍රී ලංකා බෞද්ධ විහාර දේවාල පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. ශ්‍රී ලංකා බෞද්ධ විහාර දේවාල පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන්, මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන "ශ්‍රී ලංකා බෞද්ධ විහාර දේවාල පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් එය විසින් ද, එයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද සම්පූර්ණ බලය හා අධිකාරය ද ඊට ඇත්තේ ය. ශ්‍රී ලංකා බෞද්ධ විහාර දේවාල පදනම සංස්ථාගත කිරීම.

**3**. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පරමාර්ථ සඳහා යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(i) භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපනය සඳහා සහයෝගය සහ පහසුකම් සැලසීම ;

(ii) ආධාර අවශ්‍ය භික්ෂූන් වහන්සේලාගේ අක්ත පත්‍ර ප්‍රදාන කටයුතුවල දී ද, යම් භික්ෂුවකගේ අපවත්වීමේ දී යම් තැනැත්තකුට හෝ සංවිධානවලට එම ආදාහන කටයුතු භාර ගැනීම සඳහා සහාය ලබා දීම ;

(iii) බෞද්ධ වෙහෙර විහාරස්ථාන අලුතින් ඉදිකිරීමට සහ අලුත්වැඩියා කර ගැනීම වෙනුවෙන් මූල්‍යාධාර ලබාදීම ;

(iv) නුසුදුසු ස්ථානවල පිහිටා ඇති විහාරස්ථාන වෙනුවෙන් සුදුසු ස්ථාන ලබා දීමට උපකාර කිරීම ;

(v) සිල්මාතාවන්ගේ අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ අනෙකුත් අවශ්‍යතාවලදී සහාය ලබාදීම ;

(vi) සමාජය තුළ බෞද්ධ සිරිත් සහ ආචාර ධර්ම ප්‍රවර්ධනය කිරීම;

(vii) (මෙම සංස්ථාවේ) සාමාජිකයන් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද හා අන්‍යෝන්‍ය සහයෝගය සහ අවබෝධය සඳහා උනන්දු කිරීම ;

(viii) බෞද්ධ ප්‍රතිපත්ති අනුව බෞද්ධයන්ගේ ආර්ථික, සංස්කෘතික සහ සමාජයීය අරමුණු සපුරාලීම ;

(ix) ඉඩමක් මිල දී ගැනීම, නිවසක් ඉදිකිරීම සහ ස්වයං රැකියා වැනි හදිසි පුද්ගලික අවශ්‍යතා සඳහා පොලියක් රහිතව හෝ පහසු ආපසු ගෙවීමේ ක්‍රම යටතේ අවශ්‍ය ණය පහසුකම් බෞද්ධයන්ට ලබාදීම ;

(x) බෞද්ධ ළමයින්ගේ අධ්‍යාපනය දියුණු කිරීම අරභයා, මූල්‍යමය හෝ අන්‍යාකාර සහයෝගය ලබාදීම ;

(xi) දේශීය සහ සමස්ථ ලෝකය පුරා බුද්ධ ධර්මය පෝෂණය කිරීම වෙනුවෙන් සහාය දීම ;

(xii) ධර්ම ඥානය වැඩි දියුණු කිරීම සඳහා දහම් පොත් මුද්‍රණය සඳහා සහාය දීම ;

(xiii) බෞද්ධ විහාර හා දේවාල දේපළ ආරක්ෂාව හා සංවර්ධනය උදෙසා ආධාර උපකාර කිරීම හා ඒ සඳහා සුදුසු පියවර ගැනීම ;

(xiv) පදිංචි ගෙය හෝ ඉඩම මුල්‍ය ආයතනයකට ඇපයට තබා ලබා ගෙන ඇති ණය ගෙවාගත නොහැකි වන විට එය මුල්‍යායතනය විසින් විකුණා දමා දේපළින් ඉවත් කිරීමේ අවස්ථාවට මුහුණපා සිටින බෞද්ධ තැනැත්තන් එම අවදානමෙන් මුදා ගැනීම සඳහා මැදිහත්වීම හා උපකාර කිරීම ;

(xv) බෞද්ධයන්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය විය හැකි යයි සලකනු ලබන වෙනත් යම් සහාය ලබාදීම ;

(xvi) බුද්ධ ශාසනික අභිවෘද්ධිය වෙනුවෙන් අවශ්‍ය වෙනත් වැඩ සටහන් ආරම්භ කිරීම හා ඒවා වෙනුවෙන් ආධාර කිරීම ;

(xvii) බුදුරජාණන් වහන්සේට, බුද්ධ ධර්මයට හෝ සංඝයා වහන්සේට සිදු කරන අපකීර්තියට විරුද්ධව නීතිමය පියවර ගැනීම ; සහ

(xviii) බුද්ධ ශාසනය, එහි සුරක්ෂිතභාවය, එහි වර්ධනය සහ වැඩි දියුණු වීම සහ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ද බෞද්ධයන්ගේ ද පූජනීය ස්ථානවල ද සුභසාධනය සුරක්ෂිත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා යෝග්‍ය පියවර ගැනීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම හා එකතු කිරීම, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයෙහි යෙදවීම සහ සේවයෙන් ඉවත් කිරීම ද ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ඉටු කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට හෝ අවශ්‍ය හෝ යෝග්‍ය සියළු ක්‍රියා, කාරණා සහ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) මේ පනතේ විධිවිධානවලට හෝ මේ පනත යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතුවල පරිපාලනය, සාමාජිකයන් විසි නව දෙනකුගෙන් සමන්විත පාලක මණ්ඩලයක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) එම සාමාජිකයන් විසි නව දෙනාගෙන්—

(අ) විසි එක් දෙනෙක් මහා සභාවේ රැස්වීමක දී තෝරා පත් කරගනු ලැබිය යුතු ය ;

(ආ) පහත දැක්වෙන සාමාජිකයන් නිලබලයෙන් ධූර දැරිය යුතු ය:—

(i) ශ්‍යාමෝපාලි මහ නිකායේ මල්වතු හා අස්ගිරි උභය පාර්ශ්වයන්හි මහා නායක ස්වාමීන් වහන්සේ දෙනම, අමරපුර මහා නිකාය වෙනුවෙන් එක්සත් අමරපුර මහා සංඝ සභාවේ සභාපති ධූරන්දර මහා නායක ස්වාමීන් වහන්සේ සහ ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහා නායක ස්වාමීන් වහන්සේ ;

(ii) විද්‍යෝදය මහ පිරිවෙන, විද්‍යාලංකාර පිරිවෙන, පින්වත්තේ සද්ධර්මාකර පිරිවෙන සහ බලගල්ලේ සරස්වතී පිරිවෙන යන පිරිවෙන්වල අධිපති නායක ස්වාමීන් වහන්සේලා.

(3) පාලක මණ්ඩලය විසින් සිය සාමාජිකයන් අතුරින් එහි සභාපති, උපසභාපති සහ භාණ්ඩාගාරික තෝරා පත් කර ගත යුතු අතර, සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ලේකම්වරයකු සඳහා සුදුසු තැනැත්තකු බඳවා ගැනීමේ බලය පාලක මණ්ඩලයට ඇත්තේ ය.

(4) සංස්ථාවේ ප්‍රථම පාලක මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ශ්‍රී ලංකා බෞද්ධ විහාර දේවාල පදනමේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) පහත සඳහන් සියළු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති, සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යනුකූල වන්නේය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකත්වය සඳහා ගෙවිය යුතු මුදල්, සාමාජිකයන් බඳවා ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ සාමාජිකත්වයෙන් නෙරපීම ;

(ආ) පාලක මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම හා එහි බලතල සහ කාර්ය ;

(ඇ) ධුර දරන්නන් තෝරා ගැනීම, ඔවුන්ගේ ධුර කාලය, ඔවුන්ගේ ඉල්ලා අස්වීම ඔවුන් ධුරය හිස් කිරීම, ඔවුන් ධුරයෙන් නෙරපීම සහ ඔවුන්ගේ බලතල හා කාර්ය ;

(ඈ) සංස්ථාවේ නිලධරයන්, අනුයෝජිතයන්, සහ සේවකයන්ගේ කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ඒ සඳහා ගණපූරණය හා සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ අරමුදල් ඇතුළු දේපළ පරිපාලනය සහ කළමනාකරණය කිරීම ; සහ

(උ) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. සංස්ථාවට ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, සම්මාදම් මුදල්, ගාස්තු හෝ දේශීය හා විදේශීය ආයතනවලින් හා පුද්ගලයන්ගෙන් ද සාමාජිකයන් හා සාමාජික නොවන අයගෙන් ද, මූල්‍යමය හෝ අන්‍යාකාරයෙන් ලැබෙන මුදල්වලින්, එම අරමුදල සමන්විත වන්නේ ය.

(2) සංස්ථාවට ලැබෙන මුදල් සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පාලක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබීම හා සුදුසු ආකාරයකින් ආයෝජනය කරනු ලැබීම කළ යුතු ය.

(3) සංස්ථාව විසින් එහි දේපළ පුනරුත්ථාපනය කිරීමේ, සංවර්ධනය කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්ය සඳහා ක්ෂය අරමුදලක් හෝ නිදන් අරමුදලක් පිහිටුවනු ලැබිය හැකි ය.

(4) සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා සංස්ථාව විසින් දරන ලද සියලු වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක්, ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත්කාලයේ වලංගුව පවත්නා රීතිවලට යටත්ව සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

9. සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ස්වකීය රීති අනුව යම් දේපලක් හෝ යම් ආදායමක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කර ඇත්තා වූ වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ පොදු මුද්‍රාව.

10. සංස්ථාවට පොදු මුද්‍රාවක් තිබිය යුතු අතර සභාපති හෝ උපසභාපති සහ ලේකම් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් දෙදෙනාම එහි අත්සන් තැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

11. (1) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12**. ජනරජයේ හෝ යම් රාජ්‍ය සංස්ථාගත මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.